# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## මහමෙව්නාව සදහම් සේවාව (සංස්ථාගත කිරීමේ)

**මහමෙව්නාව සදහම් සේවාව සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු විජයදාස රාජපක්ෂ මහතා විසින්
2011 පෙබරවාරි මස 08 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2011 ජනවාරි මස 24 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[68 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 8.00 යි** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

# මහමෙව්නාව සදහම් සේවාව
# (සංස්ථාගත කිරීමේ)

**මහමෙව්නාව සදහම් සේවාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි**

පූර්විකාව.

“මහමෙව්නාව සදහම් සේවාව” යනුවෙන් හඳුන්වනු ලබන සංවිධානය, එහි මූලස්ථානය සහ එහි ශාඛා ජාලය සහ ඒ සංවිධානයේ පරමාර්ථ සහ ඒ ආයතනයට සම්බන්ධ සියලු කාරණා ඒ සංවිධානයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව සාර්ථක ලෙස ඉෂ්ට කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පොල්ගහවෙල, වඩුවාව යන ස්ථානයේ සහ දිවයින පුරා පිහිටුවාගෙන ඇති හෙයින් ද :

එකී සංවිධානය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී ආයතනය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් සහ එම සංවිධානය සංස්ථාගත කරනු ලැබීමට දැන් ඉල්ලුම් කර ඇති හෙයින් ද, ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2011 අංක    දරන මහමෙව්නාව සදහම් සේවාව (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

මහමෙව්නාව සදහම් සේවාව සංස්ථාගත කිරීම.

**2.** මේ පනත ආරම්භ වීමේ දින සිට සහ ඉන්පසුව (මෙහි මින් මතු “සේවාව” යනුවෙන් සඳහන් කරනු ලබන) මහමෙව්නාව සදහම් සේවාවේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින් මතු “සංස්ථාව” යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින්මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් “මහමෙව්නාව සදහම් සේවාව” යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ සංස්ථාව විසින් සහ එයට විරුද්ධව ද එකී නාමයෙන් සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, පාවිච්චි කිරීමේ ද, තම අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරිය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) මේ ගෞතම බුදු සසුන තුළ දී ම සසර දුකින් නිදහස් වීම සහ කරවීම පිණිස ගෞතම සම්බුදුරදුන් වදාළ ශ්‍රී සද්ධර්මය පහසුවෙන් අවබෝධ වන අයුරින් සරල බසින් කියා දීම සහ බුදු සසුන බබළවාලීම ;

(ආ) බෞද්ධ ධර්මය හා බෞද්ධ භාවනාව පිළිබඳව විශේෂ දැනුමක් හා අවබෝධයක් සාමාන්‍ය ජනතාවට ලබාදීම පිණිස ත්‍රිපිටකය සරල සිංහලයට පරිවර්තනය කිරීම, දහම් පොත්, කැසට් පට, සංයුක්ත තැටි නිපදවීම, බෙදා හැරීම හා ඊට අනුබල දීම සහ දේශන, සම්මන්ත්‍රණ, සාකච්ඡා, වැඩමුළු, පන්ති, සම්මේලන, පිංකම්, උත්සව සහ වන්දනා ගමන් පිළියෙල කිරීම, සංවිධානය කිරීම සහ පැවැත්වීම ;

(ඇ) බෞද්ධ ධර්මය අනුව ජීවිතය ගොඩනගාගත් සදාචාර සම්පන්න ගිහි පැවිදි පිරිසක් බිහි කිරීම, පුහුණු කිරීම සහ නිතිපතා සිදු කරන සීල භාවනා පිංකම් තුළින් බෞද්ධ ජනතාවට ධර්මය හා භාවනාව කියාදීම සහ වඩවඩාත් ධර්මයට නැඹුරු කිරීම ;

(ඈ) ශ්‍රී ලංකාවේ විවිධ පළාත්වල මහමෙව්නාවේ ශාඛාවන් පිහිටුවා ඒ තුළින් ධර්මධර විනයධර භික්ෂූන් පුහුණු කරවීම හා කාන්තාවන් උදෙසා අනගාරික, භාවනා අසපු පිහිටුවීම ;

(ඉ) ශ්‍රී ලංකාවේ සහ ඉන් පිටත පිහිටි බෞද්ධ හෝ වෙනත් සංවිධාන සමග මිත්‍ර සම්බන්ධතා පවත්වා ගනිමින් ලොව පුරා ශ්‍රී සද්ධර්මය ප්‍රචලිත කිරීම ;

(ඊ) බෝධි ඥාන සභාව, මහා කරුණා පදනම, මහා කරුණා සුවසේවා පදනම, හරිත සුව පදනම, බුදුපුත් මාපිය දහම් සේවා පදනම සහ එවැනි ආයතන පිහිටුවා එමගින් ශ්‍රී ලංකාවේ දුෂ්කර ප්‍රදේශවල බෞද්ධ සිද්ධස්ථාන, පන්සල් ආදිය නගා සිටුවීම හා සංරක්ෂණය සඳහා දායකවීම, ගිහි පැවිදි ගිලානෝපස්ථානය සහ සමාජ සුභසාධන සේවා ඉටුකිරීම සඳහා උපකාර කිරීම ;

(උ) පුස්තකාල විඥාපන හා පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවා පවත්වාගෙන යාම, පොත්පත්, සඟරා, වාර සඟරා සහ වෙනත් ප්‍රකාශන සම්පාදනය සහ බෙදා හැරීම දිරිමත් කිරීම ;

(ඌ) විවිධ බෞද්ධ උත්සව, පූජා විධි, චාරිකා, වැඩසටහන්, ශීල භාවනා වැඩසටහන් ආදිය දිවයින පුරා පිහිටි මහමෙව්නා ශාඛා මධ්‍යස්ථානයන්හි සහ දිවයිනේ විවිධ ස්ථානවල පැවැත්වීම ;

(එ) පොල්ගහවෙල වඩුවාව මූලස්ථානයේ සහ මහමෙව්නාව සියලු ම ශාඛා මධ්‍යස්ථානවල ධර්ම ශාලා, ධාතු මන්දිර, ආවාස, භාවනා කුටි, කාර්යාල, පුස්තකාල, සීමා මාලක, දාන ශාලා, පොදු පහසුකම්, පිවිසුම් මාර්ග, ගොඩනැගිලි සහ වෙනත් ආගමික අංගෝපාංග ආදිය ඉදිකිරීම හා ඒවා පිහිටි ඉඩම් හා ඊට සම්බන්ධ චංචල හා නිශ්චල දේපළ ආරක්ෂා කිරීම, නඩත්තු කිරීම, සංවර්ධනය කිරීම හා පාලනය කිරීම ;

(ඒ) ආරාධනා කරනු ලැබූ විට සහ පූජා කරනු ලැබූ විට විදේශ රටවල ධර්ම ශාලා, ධාතු මන්දිර, ආවාස, භාවනා කුටි, කාර්යාල, පුස්තකාල, සීමාමාලක, දාන ශාලා, පොදු පහසුකම් පිවිසුම් මාර්ග, ගොඩනැගිලි සහ වෙනත් ආගමික අංගෝපාංග ආදිය ඉදිකිරීම හා ඒවා පිහිටි ඉඩම් හා ඊට සම්බන්ධ චංචල හා නිශ්චල දේපළ ආරක්ෂා කිරීම, නඩත්තු කිරීම, සංවර්ධනය කිරීම හා පාලනය කිරීම ;

(ඔ) දඹදිව බෞද්ධ පුනර්ජීවනයක් ඇති කරනු පිණිස එහි ධර්ම ශාලා, ධාතු මන්දිර, ආවාස, භාවනා කුටි, කාර්යාල, පුස්තකාල, සීමාමාලක, දානශාලා, පොදු පහසුකම් පිවිසුම් මාර්ග, ගොඩනැගිලි සහ වෙනත් ආගමික අංගෝපාංග ආදිය ඉදිකිරීම හා ඒවා පිහිටි ඉඩම් හා ඊට සම්බන්ධ චංචල හා නිශ්චල දේපළ ආරක්ෂා කිරීම, නඩත්තු කිරීම, සංවර්ධනය කිරීම හා පාලනය කිරීම ;

(ඕ) ඉහත සඳහන් පරමාර්ථ සියල්ල ම හෝ යමක් සාක්ෂාත් කරගැනීමට හිතකර හෝ ආනුෂංගික වන වෙනත් සියලු ක්‍රියා හා දේ කිරීම.

**4.** (අ) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා නීති රීතිවලට අනුකූලව තෝරා පත්කර ගන්නා නිලධාරීන්ගෙන් සමන්විත (මෙහි මින් මතු "පාලක භාරකාර මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක භාරකාර මණ්ඩලයක් වෙත මේ පනතේ විධිවිධානවලට සහ සංස්ථවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව පැවරෙන්නේ ය. සංස්ථාවේ කටයුතු කළමනාකරණය.

(ආ) මෙම වගන්තියේ (අ) වන උපවගන්තියේ කුමක් සඳහන් වුව ද ආරම්භක ප්‍රධාන අනුශාසක වන අතිපූජ්‍ය කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමීන් වහන්සේ පාලක භාරකාර මණ්ඩලයේ ප්‍රධාන අනුශාසක විය යුතු ය.

(ඇ) සංස්ථාවේ ප්‍රථම පාලක භාරකාර මණ්ඩලය මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී ආයතනයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සහ අනෙකුත් සාමාජිකයන්ගෙන් සමන්විත වන්නේ ය.

**5.** (1) සංස්ථාව විසින් කලින් කල සභාවේ රැස්වීමක දී ඡන්දය දෙන පාලක භාරකාර මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් 2/3 කට නොඅඩු ඡන්දයකින් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සෑදීම සඳහා නීත්‍යානුකූල වන්නේ ය :— සංස්ථාවේ රීති.

(අ) පාලක භාරකාර මණ්ඩලයට සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම ;

(ආ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුනියෝජිතයන් සහ අනුකාරක මණ්ඩල පත්කිරීම, ඔවුන්ගේ බලතල, කාර්ය, කර්තව්‍ය සහ පැවැත්ම ;

(ඇ) පාලක භාරකාර මණ්ඩලයට සාමාජිකයන් තෝරාපත් කර ගැනීම, ඔවුන් ඉල්ලා අස්වීම, ධුරය අත්හැරීම, ධුරයෙන් නෙරපීම, ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය හා කර්තව්‍ය ;

(ඈ) සදහම් සේවාවේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය, ඒ රැස්වීම කැඳවීම සහ පැවැත්වීම, රැස්වීම පවත්වන වේලාවන්, රැස්වීම පිළිබඳ නිවේදන, න්‍යාය පත්‍රය, ගණපූරණය, රැස්වීම්වල දී ඡන්දය පාවිච්චි කිරීම, රැස්වීම්වල දී සාකච්ඡාවට භාජනය කළ යුතු කරුණු ;

(ඉ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

සංස්ථාවේ ආදායම් දේපළ ආදිය යෙදවිය යුතු ආකාරය.

**6.** කවර ආකාරයකින් හෝ ලැබුණා වූ සංස්ථාවේ ආදායම සහ දේපළ මෙහි දක්වා ඇති පරිදි සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම උදෙසා පමණක් යොදාගනු ලැබිය යුතු අතර, ඉන් කිසිම කොටසක්, ලාභාංශයක්, ප්‍රසාද දීමනාවක් හෝ අන් කවර හෝ ලාභයක ආකාරයෙන් සංස්ථාවේ සාමාජිකයන්ට හෝ අන් අයකුට ගෙවීම හෝ පැවරීම හෝ කරනු නොලැබිය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**7.** (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, තෙස්තමේන්තු තීයාදන, පැවරුම්, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු, ප්‍රදාන හෝ මුල්‍ය ආයෝජන වශයෙන් මේ දක්වා ලැබූ හෝ මින් මතු සංස්ථාවට ලැබෙන හෝ සියලු මුදල්, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන බැංකු එකක හෝ වැඩි ගණනක සංස්ථවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ බලතල සහ කාර්ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා සංස්ථාව විසින් දරනු ලැබූ සියලු වියදම් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

විගණනය සහ ගිණුම්.

**8.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව සහ පාලක භාරකාර මණ්ඩලය විසින් එහි ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම්, මණ්ඩලය විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද යම් ආයතනයක හෝ

සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා ඒ ආයතනය විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා ඒ ආයතනය විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, සාමාජිකයන්ගෙන් යුත් එවැනි ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

**සංස්ථාව විසින් ගෙවිය යුතු සහ සංස්ථාවට අයවිය යුතු ණය මුදල්**

**9.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සේවාව විසින් ගෙවිය යුතු සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට සේවාවට අයවිය යුතු සියලු ණය, සේවාවට ගෙවිය යුතු සම්මාදම් මුදල් සහ දායක මුදල්, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

**සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.**

**10.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෙස්තමේන්තු නීයාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව වෙත පවරනු ලැබූ චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්පත් කරගැනීමට සහ දැරීමට නීතියෙන් හැකියාව හා බලය සංස්ථාවට ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ පූර්ණ බලය ඇතිව සංස්ථාවේ රීතිවලට යටත්ව සංස්ථාව විසින් දැරිය යුතු ය. සියලු දේපළ සංස්ථාවේ නමින් පමණක් දැරිය යුතු වේ.

**සංස්ථාවේ මුද්‍රාව.**

**11.** ප්‍රධාන අනුශාසක ස්වාමීන් වහන්සේ හෝ භාණ්ඩාගාරික ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයේ තම නම අත්සන් කළ යුතු ය. එසේ කරනු ලබන අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු කළ අත්සනකට පරිබාහිර විය යුතු ය.

**12.** සංස්ථාව විසුරුවනු ලැබුවහොත් එහි සියලු විගණන සහ බැරකම් ගෙවා සමථයකට පත් කරනු ලැබීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරි වේ නම් ඒ දේපළ සංස්ථාවේ කවර හෝ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු ය. එහෙත් සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, යම් ආදායමක් හෝ ලාභ කිසිවක් තම සාමාජිකයන් අතර බෙදාදීම රීති මගින් තහනම් කරනු ලැබ ඇත්තා වූ ද, වෙනත් සංගමයකට හෝ සංගම්වලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. මේ සියලු තීරණ සංස්ථාවේ පාලක භාරකාර මණ්ඩලයේ අනුමැතියට යටත් විය යුතු ය.

විසුරුවා හැරීමෙන් පසු ඉතිරිවන දේපළ.

**13.** මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින් ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තෙකු හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**14.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.